සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

මගේ අංකය / எனது இல / My No: SDD/HO/IT/BIMS
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2017.06.23

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

<u>අඩු ආදායම්ලාභී පවුල් සමීක්ෂණය පදනම් කරගෙන විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුව සමෘද්ධි සහනාධාරලාභීන් තෝරා ගැනීම</u>

දිවයින පුරා විසිරී සිටින අඩු ආදායම්ලාභීන් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර එම තොරතුරු පරිගණක පද්ධතියකට ඇතුලත් කර ඇත. එම පරිගණකගත කරන ලද තොරතුරු, සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව නව විද්‍යාත්මක ක්‍රමවේදයක් යොදා ගනිමින් ඇගයීමට ලක්කර ඇත.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මාසිකව විද්‍යානුකූලව සකස් කරනු ලබන දරිද්‍රතා රේඛාවක වටිනාකම ප්‍රසිද්ධියට පත් කරනු ලබයි. එම ප්‍රකාශය අනුව 2017 මැයි මස දිවයිනේ දරිද්‍රතා රේඛාව ලෙසට මසක ඒකපුද්ගල ආදායම රු.4,284/- ක් ලෙසට ප්‍රකාශ කර ඇත. තවද මෙම සමීක්ෂණයේදී එක් නිර්ණායකයක් යටතේ දරිද්‍රතා රේඛාව ලෙස තෝරාගෙන ඇත්තේ ඒක පුද්ගල ආදායම රු.6,000/- කි. එම තත්ත්වය මත හතරදෙනෙකුගෙන් යුත් පවුලක මාසික ආදායම රු. 24,000/- වනු ඇත. අඩු ආදායම්ලාභීන්ගේ දුගීබව නිශ්චිත කර ගැනීම සඳහා විද්‍යානුකූලව තෝරාගත් ප්‍රධාන නිර්ණායක 6 ක් හා අනු නිර්ණායක 29 යොදාගෙන ඇති අතර ඔබ වෙත එවනු ලබන නාම ලේඛනය සකසා ඇත්තේ එම පදනම සැලකිල්ලට ගෙනය.

එම නිර්ණායකයන් පහත පරිදි වේ.

1. අධ්‍යාපනය
   - 1.1 පවුලේ කිසිම සාමාජිකයෙකු සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා නොමැති වීම
   - 1.2 ගෘහ මූලිකයා 8 වන ශ්‍රේණිය සමත්ව නොමැති වීම
   - 1.3 පාසල් යන වයසේ සිටින නමුත් පාසල් නොයන ළමයෙකු සිටීම

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

2. සෞඛ්‍ය

2.1 පවුල් සාමාජිකයෙකු දීර්ඝ කාලීන රෝගයකින් පෙලීම

2.2 පවුලේ සාමාජිකයෙකු අබාධිත තත්ත්වයේ සිටීම

3. ආර්ථික තත්ත්වය

3.1ඒක පුද්ගල වියදම රු. 5,500 ට අඩුවීම

3.2 ඒක පුද්ගල ආදායම් රු.6,000 කට අඩුවීම

3.3 ආහාර පරිභෝජනය සඳහා ණය ලබා තිබීම

3.4 සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ණය ලබා තිබීම

4. වත්කම්

4.1 ඉල්ලුම්කාර පවුලට පදිංචිය සඳහා තමාට අයිති නිවසක් නොතිබීම

4.2 පදිංචි නිවසට අමතරව තවත් නිවසක් හෝ ගොඩනැගිල්ලක් නොතිබීම

4.3 අක්කර 0.5 කට වැඩි ගොඩ ඉඩමක් නොතිබීම

4.4 අක්කර 1 කට වැඩි මඩ ඉඩමක් නොතිබීම

4.5 අනෙකුත් වත්කම් යටතේ පාපැදි , යතුරු පැදි, ස්කූටර් හැර වෙනත් වංවල වත්කම් නොතිබීම

4.6 ගෘහ උපකරණ යටතේ ගුවන් විදුලි, රූපවාහිණි, විදුලි පංකා, ජංගම දුරකතන, පරිගණක (රු. 10,000 අඩු) හැර වෙනත් උපකරණ නොතිබීම

4.7 පෝරමය අංක 7 යටතේ 7 C හි ඇති යන්ත්‍ර හා උපකරණ නොතිබීම

4.8 සත්ව පාලනය හා ජලජීවී වගාව යටතේ හරක් 10 ක් , එළුවන් 20 , කුකුළන් 50 හා තාරාවන් 50 කට අඩු සතුන් සංඛ්‍යාවක් සිටීම.

5. නිවස

5.1 ඉල්ලුම්කරු පදිංචි නිවස පැල්පත්, මුඩුක්කු, පේලි /ලයින් කාමර වල පදිංචිව සිටීම.

5.2 පදිංචි නිවසේ බිත්ති මැටිගල්, මැටි, ලෑලි, ටකරන්, පොල්අතු, තල් අතු ආදිය

ගෙබිම මැටි, වැලි ආදියද

වහල ටකරන්, පොල් අතු, පිදුරු ආදියෙන්ද සමන්විතව තිබේ.

5.3 නිදා ගැනීමට පමණක් වෙන්වූ එක් කාමරයක් තිබීම

5.4 ගෙබිම වර්ගඵලය වර්ග අඩි 500 ට අඩුවීම

5.5පරිභෝජනය සඳහා පිරිසිදු ජලය ලබා ගැනීමට නොහැකි වීම

5.6 නිසි වැසිකිලි පහසුකම් නොතිබීම

5.7 ආලෝකය ලබා ගැනීම සඳහා භූමිතෙල් වැනි ක්‍රම භාවිතය

6. පවුලේ සෞඛ්‍ය තත්ත්වය

6.1 දිනකට එක් ආහාර වේලක් පමණක් ලබා ගැනීම

6.2 සතියකට එක් වරක් හෝ මස්, මාළු, කිරි, බිත්තර පරිභෝජනය කිරීමේ හැකියාව නොතිබීම

6.3මාස 06 කට එක් වරක් හෝ මුළු පවුලටම ඇඳුම් ගැනීමේ හැකියාව නොතිබීම.

6.4 පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයකින් බෙහෙත් ගැනීමට හැකියාව නොතිබීම

ඉහත සඳහන් කර ඇති අනු නිර්ණායක 29 යටතේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව බර තැබීමට ලක් කරනු ලැබේ. යම් නිර්ණායකයක් යටතේ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිටින පවුල් සංඛ්‍යාව මත එම නිර්ණායකය සඳහා ලකුණු ප්‍රමාණය තීරණය වේ. මෙලෙස සියළු නිර්ණායක සඳහා ලැබෙන ලකුණු වල එකතුව 100 ක් වන අතර ඇගයීමට ලක් කරනු ලබන පවුල සුදුසුකම් ලබනු ලබන නිර්ණායක වලට අනුව ලකුණු හිමිවේ. මෙහිදී වැඩිම ලකුණු හිමිවන පවුල දුප්පත්කමින් වැඩි ලෙස සලකනු ලැබේ.

**2. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමීක්ෂණයට භාජනය කර ඇති පවුල් සංඛ්‍යාව දුප්පත්කමේ අනුපිලිවෙලට හඳුනාගැනීම සඳහා පහත ක්‍රමවේදයන් අනුගමනය කල යුතුය.**

ඔබ වෙත අඩු ආදායම්ලාභී පවුල් සමීක්ෂණ සඳහා ඉල්ලුම්කරන ලද ඉල්ලුම්කරුවන් ඉහත නිර්ණායක 29 යටතේ ඇගයීමට ලක්කර ඒ ඒ පවුල ලබාගත් ලකුණු මට්ටම අනුව අවරෝහන පිලිවෙලට සකස් කල නාම ලේඛනය Excel ගොණුවක් ලෙස ලබාදෙනු ලැබේ. මීට අමතරව PDF ලෙස සකස් කර ඇති වෙනස් කල නොහැකි ගොණුවක්ද මේ සමග ලබාදේ.

ලබාදෙනු ලබන Excel ගොණුවේ පහත පියවරයන් අනුගමනය කල යුතුය.

1. සමීක්ෂණය සිදුකල කාලයේ සිට මේ දක්වා යම් පවුලක සහනාධාර ඉවත්කර ඇත්නම් පලමුව එම නම් අප ලබාදී ඇති ලේඛනයෙන් ඉවත්කර ගත යුතුය.

2. දත්ත ඇතුලත් කිරීමේදී යම් ආකාරයට ද්විත්ව ඇතුලත් කිරීම් (Duplicate Entries) සිදුවී ඇත්නම් එහි ඇති අදාල නොවන නම Excel ලේඛනයෙන් ඉවත්කල යුතුය. මෙලෙස ඉවත් කරනු ලබන සියළුම නම් වලට අදාල User ID සටහන් තබාගෙන ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතුය.

3. ලබාදී ඇති ලකුණු වලට ඉදිරියෙන් value (වටිනාකම) ලෙස column (තීරුවක් ) නම් කර සකස් කර ගන්න.

4. **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැනට ලබාදෙනු ලබන සහනාධාර පවුල් සංඛ්‍යාව හා මුදල පදනම් කරගෙන සහනාධාර වටිනාකම් මත දෙනු ලබන පවුල් සංඛ්‍යාව තීරණය කල යුතුය.**

5. සහනාධාරලාභීන් තෝරා ගැනීමේ කමිටුව මගින් තීරණය කරන ලද රු. 3,500/- වටිනාකම යටතේ ලබාදෙනු ලබන සහනාධාර ප්‍රමාණයෙන් 85% ක් ගණනය කර වැඩිම ලකුනේ සිට පහලට value ලෙස නම්කරගත් තීරුවේ ලකුණු කරන්න.
   ඉන්පසු රු. 2,500/- වටිනාකම යටතේ සහනාධාර ලබාදෙන පවුල් සංඛ්‍යාවෙන් 85% ගණනය කර රු. 3,500/- සහනාධාරය ලකුණු කල තැන සිට පහලට value තීරුවේ සටහන් කර ගන්න. එම ආකාරයට රු. 1,500/- හා රු. 420/- ද අදාල ප්‍රමාණයන්ද ඇතුල් කරන්න. තවද රු. 1500 සහනාධාර වටිනාකම

යටතේ සහනාධාර ලබා ගන්නා පවුල් සංඛ්‍යාව තීරණය කිරීමේදී අප විසින් සංගනනයට ලක් නොකල පූජ්‍ය පක්ෂය ළමා නිවාස හා වැඩිහිටි නිවාස වල සංඛ්‍යාවද ඇතුළුව 85% ප්‍රමාණය ගණනය කල යුතුය.

6. Value තීරුවේ සහනාධාර වටිනාකම සටහන් කර ගැනීමෙන් පසු Excel ගොණුවේ GND (ග්‍රාම නිලධාරී වසම) තීරුව තෝරාගෙන A-Z ලෙස Sort කරන්න. එසේ කරගත් පසු ග්‍රාම නිලධාරී වසමට අයත් නම් සියල්ල එක් තැනකට ගොණුවන අතර ග්‍රාම නිලධාරී වසම් අනුව ලකුණු මට්ටම හා සහනාධාර වටිනාකමද සටහන්ව ලේඛනය ලැබේ.

7. එලෙස ලබාගත් ලේඛනයේ සහනාධාර හිමි පවුල්වල නම් පමණක් සිංහල හා ද්‍රවිඩ භාෂා වලින් සකස් කර සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රදර්ශනය කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

නීල් බණ්ඩාර හපුහින්න,
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

පිටපත් -1. සමාජ සවිබල ගැන්වීම්, සුබ සාධන හා කන්ද උඩරට උරුමය පිළිබද ගරු අමාත්‍යතුමා - කා. දැ.පි
2. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා. දැ.පි.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.හා අ.ක.ස
4. සියලුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.හා අ.ක.ස